# මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන ආයතනයන්හි පෙර පාසල් පාලිකා තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය - සංශෝධන අංක 01

| ඡේද අංකය | දැනට පවතින පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|---|
| 9.3.5 (බඳවා ගැනීමේ ක්‍රමය) | ලිඛිත තරඟ විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන් ලබා ගත් මුළු ලකුණුවල ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගය සමත් වී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සමත් වූවන්ගේ ලිඛිත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණවල ලකුණු එකතුවෙහි ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ. | 9.3.5 (බඳවා ගැනීමේ ක්‍රමය) | සීමිත හා විවෘත යන දෙඅංශයෙන් ඉල්ලුම්පත් කැඳවා ලිඛිත තරඟ විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සමත් වූවන්ගේ ලිඛිත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණවල ලකුණු එකතුවෙහි ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම පහත උප ඡේද පරිදි සිදු කරනු ලැබේ. | I. බඳවා ගැනීමේදී හා බඳවා ගත් නවක නිලධාරීන් ස්ථානගත කිරීමේදී පවතින ගැටළු හේතුවෙන් දිස්ත්‍රික් ජන අනුපාතිකය අනුව බඳවා ගැනීමට හැකිවන පරිදි බඳවා ගැනීම් සිදු කිරීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබා දුන් උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා.<br><br>II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 හා 28/95 අනුව රාජ්‍ය සේවයේ තනතුරු සඳහා විවෘත තරඟ විභාග මඟින් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී ජනගහණ අනුපාතය සලකා බැලිය යුතු වීම. |
| 9.3.5.1 | දැනට පවතින පෙළක් නැත. | 9.3.5.1 | විවෘත පදනම මත සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනම මත කෙරෙනු ඇත. මධ්‍යම පළාතට අයත් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන ගහණයට සමානුපාතිකව එම එක් එක් දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරඟ කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.<br><br>මෙම පළාතේ යම් දිස්ත්‍රික්කයකට ඉහත පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා ඉල්ලුම් කරන ලද සුදුසුකම් සපුරාලන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවලදී, එම පුරප්පාඩු සංඛ්‍යාව මධ්‍යම පළාතේ අනෙකුත් දිස්ත්‍රික්ක දෙක සඳහා එක් එක් දිස්ත්‍රික්කයේ ජන ගහණ අනුපාතයට සමානුපාතිකව නැවත බෙදා හරිනු ඇත. | |
| 9.3.5.2 | දැනට පවතින පෙළක් නැත. | 9.3.5.2 | විවෘත පදනම මත මධ්‍යම පළාත තුළ පිරවීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව දිස්ත්‍රික් ජනගහණ අනුපාත පදනම යටතේ ගණනය කිරීමට නොහැකි තරම් අවම වූ විට හෝ විවෘත තරඟ විභාගය සමත්වන අයදුම්කරුවන් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වන විට දිස්ත්‍රික් ජනගහණ අනුපාත පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.එවිට ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගේ ලකුණු ප්‍රමුඛතාවයෙහි අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021 - 08 - 04 දින
අනුමත කරන ලදී

වයි.එම්.ඒ. මිහිරාන් බණ්ඩාර
සහකාර ලේකම්
මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් වෙනුවට

(33)

| | | | | |
|---|---|---|---|---|
| 9.3.5.3 | දැනට පවතින පෙළක් නැත. | 9.3.5.3 | සීමිත පදනම මත බඳවා ගැනීමේදී ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන් ලබා ගත් මුළු ලකුණු ප්‍රමුඛතාවය අනුව සීමිත පදනම මත පිරවීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021-05-04 දින
අනුමත කරන ලදී

වයි.එම්.ඒ. මිහිරාන් බණ්ඩාර
සහකාර ලේකම්
මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් වෙනුවට